# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# සිතාසි


ලිපිනය (ප්‍රධාන කාර්යාලය) : නො. 14, ආර්.ඒ.ද. මැල් මාවත, කොළඹ 04.
දුරකථන : 011-2505580-82
ක්ෂණික ඇමතුම් : 1996
ෆැක්ස් : 2505574
විද්‍යුත් තැපැල් : sechrcsl@gmail.com
වෙබ් : WWW.hrcsl.lk


**1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 18 වගන්තිය ප්‍රකාර විභාග වලට අදාළ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා පනතේ 20 (2) වන වගන්තිය අනුව නිකුත් කරනු ලබන්නකි.**

---

**පැමිණිලි අංක : HRC/1401/22 , HRC/SUO/MOTU/07/22**

නීතිඥ සේනක පෙරේරා මයා,
සභාපති,
සිරකරුවන් සුරැකීමේ සංවිධානය,
170, අටත්කඩේ වීදිය,
කොළඹ 12.

**2022.05.09 වන දින සිදුවූ සිදුවීම් මාලාව තුළ නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීමට අපොහොසත් වීම සම්බන්ධව කරුණු විමසීම සඳහා කොළඹ 04, ආර්.ඒ ද මැල් මාවත, අංක 14 හි පිහිටි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ හය වන මහලේ දී 2022 ක් වූ මැයි මස 25 වන දින පෙ.ව 9.00 ට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු රෝහිණී මාරසිංහ මැතිනියගේ අධීක්ෂණය යටතේ පත්කරන ලද විශේෂ නියෝජිත (special rapporteur)) ඉදිරියේ** පෙනී සිටීමට මෙයින් නියම කරනු ලැබේ. එසේම මෙම පැමිණිල්ලට අදාළ සියළු ලේඛන එදිනට ඔබ විසින් ඉදිරිපත් කළ යුතු වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 20(3) වගන්තියට අනුව සිතාසියක් භාරදෙනු ලැබූ සෑම තැනැත්තෙකුම එම සිතාසියේ සඳහන් කර ඇති වේලාවේදී හා ස්ථානයේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිය යුතු අතර, කොමිෂන් සභාව විසින් අසනු ලබන ප්‍රශ්න වලට උත්තරදීම හෝ ඉදිරිපත් කරන ලෙස සිතාසියේ භාවයට අනුව ඔහුට/ඇයට නියම කර ඇති සහ ඔහුගේ/ඇයගේ සන්තකයේ හෝ බලයෙහි ඇති ලේඛන හෝ වෙනත් දේ ඉදිරිපත් කළ යුතුය.

ඒ අනුව පනත යටතේ භාර දෙන ලද සිතාසියක් සඳහා නියමිත වේලාවේදී හා ස්ථානයේදී කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම සහ විභාගය/විමර්ශනය කරමින් පවතින කරුණු සම්බන්ධව තමා වෙත ඉදිරිපත් කරනු ලැබූ ප්‍රශ්නයකට පිළිතුරු දීම හෝ කොමිෂන් සභාවේ මතය අනුව විමර්ශනය කළ යුතු කාරණා වල සත්‍යතාවය නිගමනය කිරීම සඳහා අවශ්‍ය වූ තම සන්තකය හෝ බලය යටතේ ඇත්තා වූ යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම සහ පෙන්වීම කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කිරීම හෝ පැහැර හරිනු ලැබීම හෝ එවැනි පැහැර හැරීමක් කොමිෂන් සභාවේ අධිකාරියට විරුද්ධව සිදුකරන ලද්දක් ලෙස සලකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 21 වන වගන්තිය ප්‍රකාර ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් ලැබිය හැකි වරදකි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනියගේ අත්සන යටතේ,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ලේකම්
වර්ෂ 2022 ක් වූ මැයි මස 23 වන දින දිය.

**රන්ජිත් උයන්ගොඩ**
**ලේකම් (වැ.බ)**
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**